පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

ආයතනයේ නම : සීමා නිර්ණය කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளிப்படுத்துகைத் தொடர்: 79

நிறுவனத்தின் பெயர் : எல்லை நிருணய ஆணைக்குழு

பாராளுமன்றத்தின் அரச கணக்குகள் தொடர்பான செயற் குழுவினால் சபையில் முன் வைக்கப்பட்ட அறிக்கைகள் தொடர்பான நிலையியற் கட்டளை இலக்கம் 119(4) ன் கீழ் நிறுவனத்திற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புகள் மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகள் தொடர்பாக பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No : 79

Name of the Institution : Delimitation Commission

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on public Accounts in terms of Standing Order No. 119(4)

| ආකෘති අංක - 01 | |
|---|---|
| පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 79 | |
| ආයතනයේ නම : සීමා නිර්ණය කොමිෂන් සභාව | |
| කමිටුව විසින් හඳුනා ගනු ලැබූ දුර්වලතා | දුර්වලතා/ වත්මන් තත්වය පිටු දැකීම සඳහා ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග |
| අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය පවත්වා නොතිබුණි | මේ වන විට අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනයක් සකස් කර ඇත. |
| අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත. | අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යමින් පවතී. |
| මු. රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දි පිළියෙල කර නොතිබුණි. | ස්ථිර අභ්‍යන්තර විගණකවරයෙකු කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර ගැනීමට තරම් වාර්ෂික අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් නොවන බැවින් සහ කාර්ය ප්‍රමාණයක් නොපැවරෙන බැවින් වෙනත් ආයතනයක අභ්‍යන්තර විගණකවරයෙකු ලවා අභ්‍යන්තර විගණන වැඩ සටහන සකස් කර ගැනීමට කටයුතු කරමි. |
| සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි. | ඉදිරි වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට ක්‍රියා කරමි. |
| ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා නොතිබුණි. | ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් මේ වන විට නිර්මාණය කර ක්‍රියාත්මක වෙමින් පවතී. එහි ලිපිනය http//delimitationcommission.blogspot.com වේ. |
| ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. | ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දීමට කටයුතු කරන ලෙස කාර්ය මණ්ඩලය වෙත උපදෙස් නිකුත් කරන ලදී. |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. ෙකොමිෂන් සභාවට පැවරෙන සීමා නිර්ණය කටයුතු සඳහා අවශ්‍ය සීමිත කාර්ය මණ්ඩලයක් පමණක් ස්ථිරව බඳවා ගෙන ඇත. |
| සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. | ඉදිරියේදී සකස් කරන මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබා දීමට අවශ්‍ය පුහුණු අවස්ථා හඳුනාගෙන ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. |
| මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර නොතිබුණි. | මේ වන විට මේ සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර ඇත. |

| | |
|---|---|
| ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හදුනා ගෙන නොතිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථාවලින් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් දැක්වේ. ඒ අනුව, පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කටයුතු නිශ්චිතව පැවරී ඇත. ඒ හැර වෙනත් කාර්ය භාරයන් හා බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවේ. |
| හදුනා ගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක් තීරණ කර නොතිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථාවලින් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් දැක්වේ. ඒ අනුව, පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කටයුතු නිශ්චිතව පැවරී ඇත. ඒ හැර වෙනත් කාර්ය භාරයන් හා බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවේ. |
| හදුනා ගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථාවලින් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් දැක්වේ. ඒ අනුව, පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කටයුතු නිශ්චිතව පැවරී ඇත. ඒ හැර වෙනත් කාර්ය භාරයන් හා බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවේ. |
| සැලසුම් ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | සීමිත කාර්ය මණ්ඩලයක් පමණක් ස්ථිරව අනුයුක්ත කර ඇත. ඔවුන් මෙයට පෙර සේවය කළ ස්ථාන වලදී අවශ්‍ය පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කර ඇති අතර, ඉදිරියේ දී අවශ්‍යතාවය අනුව, පුහුණුව සඳහා අදාල ආයතන වලට යොමු කිරීමට සැලසුම් කර ඇත. |
| විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ වන විට අදාල නිර්දේශ ක්‍රියාත්මක කර ඇත. |
| 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්ය භාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධන දර්ශක 03ක් හදුනාගෙන නොතිබුණි. | කාරයභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මැනිය හැකි කාර්ය සාධන දර්ශක 03ක් හදුනාගෙන ඒ අනුව ක්‍රියා කරමින් පවතී. |

බී.පී.සී.කුලරත්න
ලේකම් ( වැ.බ.)
සීමා නිර්ණය කොමිෂන් සභාව